**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

# Bitesize

# Training

# BITESIZE - ඉන්ටනෙට් පිළිබඳ හඳුන්වාදීමක්

මෙම පිටුව සැලසුම් කර ඇත්තේ, පුහුණුවෙන්නන් විසින් මොබයිල් ඉන්ටනෙට් පිළිබඳ අසන පොදු ආකාරයේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට පුහුණුකරුවන්ට උපකාර කිරීම සඳහාය. සාමාන්‍යයෙන් පුද්ගලයන් ඉන්ටනෙට් පිළිබඳ නිතර අසන සමහර ප්‍රශ්නවලට සරල පැහැදිලි කිරීම් එහි ඇත. මෙම පත්‍රිකාවේ මුද්‍රිත පිටපතක් ළඟ තබාගැනීම පුහුණුකරුවන්ට පහසුවක් වනු ඇත. මෙම ආධාරක කට්ටලයේ ඒ ඒ මොඩියුලවලට මෙම කොටස් අන්තර්ගත කර ඇති බවද ඔබට වැටහෙනු ඇත.

## ඒ කුමක්ද?




**'ඉන්ටනෙට් පෝස්ටරය' පෙන්වන්න** "ඉන්ටනෙට් යනු, ලොව පුරා ඇති මිලියන ගණනක පරිගණක; දුරකතන මාර්ග, පණිවුඩ චන්ද්‍රිකා සහ කම්බි මගින් එකිනෙකට සම්බන්ධ වී හැදුණු ජාලයකි. එය නිරන්තරයෙන්ම වර්ධනය වන අතර, එමගින් ඔබට ඉතා විශාල පරිමාණයක තොරතුරු හා සේවාවන් රැසක් ලබාගත හැකිවේ. ඉන්ටනෙට්, හැමදෙනාම වෙනුවෙනි. එය භාවිතාකිරීමට හැකි සහ නොහැකි අය ලෙස කිසිවෙකුට සීමා පනවා නැත. කම්පියුටරයක්, මොබයිල් ෆෝන්-එකක් හෝ ටැබ්ලට්-එකක් සමග 'ඩේටා' සම්බන්ධතාවක් ඇති ඕනෑම කෙනෙකුට ඉන්ටනෙට් වෙත පිවිසීමට හැකිය."

## එය යොදාගත හැක්කේ කුමක් සඳහාද?


"ඔබට විවිධාකාර දේ කිරීමට ඉන්ටනෙට් උපකාර වනු ඇත. උදාහරණ වශයෙන්, පවුලේ අය සහ මිතුරන් සමග පණිවුඩ හුවමාරු කරගැනීමට හෝ කතාකිරීමට, ඡායාරූප යැවීමට, වීඩියෝ බැලීමට, සංගීතයට සවන් දීමට, භාණ්ඩ හා සේවා මිලට ගැනීමට හා ඒවා සඳහා ගෙවීම් කිරීමට එමගින් ඉඩ සැලසේ. ඊට අමතරව, ඕනෑම විෂය ක්ෂේත්‍රයකම පාහේ; එනම් ප්‍රවෘත්ති, කාලගුණය, විනෝදාස්වාදය, ප්‍රවාහන කාල සටහන්, ආගම් හෝ ක්‍රීඩා ආදී තොරතුරු සොයා ගැනීමට එමගින් හැකිවේ. ඔබ රැකියාවක් සොයනවා නම්, සෞඛ්‍ය උපදෙස් අවශ්‍ය නම් හෝ අලුත් කුසලතාවක් ඉගෙන ගැනීමට අවශ්‍ය නම්; එහිදී ද ඉන්ටනෙට් ඔබට උපකාරී වේ."

**පැහැදිලි කරන්න**: පුහුණුකරන්නා විසින් internet මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සිය පෞද්ගලික උදාහරණ මෙන්ම, එය භාවිතා කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳ පැහැදිලි කරදෙන්න.

පුහුණුවෙන්නාට **එය අදාළ කරන්න**: පුහුණුවෙන්නාගේම ජීවිතයේ කටයුතුවලදී මෙය ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

**ඉන්ටනෙට් වෙත පිවිසීමට, ආකාර දෙකක මොබයිල් ෆෝන් භාවිතා කළහැක**




**1. ස්මාර්ට්ෆෝන්**: මෙම ෆෝන්, කුඩා පරිමාණයේ පරිගණකයක් වැනිය. සාමාන්‍යයෙන් එය ක්‍රියාත්මක කරන්නේ එහි තිරය ස්පර්ෂ කිරීමෙන් මිස බොත්තම් එබීමෙන් නොවේ. ඒවා මගින්, ඡායාරූප ගැනීමට, සංගීතය වාදනය කිරීමට හා වීඩියෝ බැලීමට හැකි අතර, එහි ඇති 'ඇප්ස්'(apps)නැමති පරිගණක වැඩසටහන් මගින්, ඔබට සැණෙකින් ඉන්ටනෙට් සේවා ලබාගත හැකිය.



**2. ෆීචර් ෆෝන්**: මේවා ස්මාර්ට්ෆෝන්වලට වඩා අඩු ලක්ෂණ (features) සහිත ය. ස්පර්ෂ කිරීමෙන් ක්‍රියාත්මක කළහැකි තිරයක් නැති නමුත්, සංගීතය වාදනය කිරීමේ හා ඡායාරූප ගැනීමේ හැකියාව එහි ඇත. බ්‍රවුසරයක් මගින් ඉන්ටනෙට් වෙත පිවිසී ඔන්ලයින් සේවා භාවිතා කිරීමේ හැකියාව එහි ඇත.

## 'ඩේටා' පිරිවැය




"ඔබේ මොබයිල් ෆෝන්-එකෙන් ඉන්ටනෙට් වෙත පිවිසීමට, ඔබට මොබයිල් 'ඩේටා' සම්බන්ධතාවක් හෝ වයි-ෆයි (Wi-Fi) සම්බන්ධතාවක් භාවිතා කළහැක." **'ඩේටා' පෝස්ටරය පෙන්වන්න.**

"සාමාන්‍යයෙන්, ඔබේ ෆෝන් එකෙන් ඔබ ඉන්ටනෙට් භාවිතා කිරීමේ දී, ඔබ භාවිතා කරන්නේ මොබයිල් 'ඩේටා' ය. ඒවා ඔබේ මොබයිල් ජාල සැපයුම් ආයතනයෙන් හෝ පෙරගෙවීම් ලෙස 'ඩේටා' අලෙවිකරන වෙළඳසැළකින් මිලට ගතයුතුය.

ඉන්ටනෙට් හිදී ඔබ කරන සමහර දේවල් - එනම් වීඩියෝ බැලීම හෝ සංගීතයට සවන්දීම; වැඩිපුර 'ඩේටා' පරිභෝජනය කරන අතර, ඒ නිසාම ඔබට ඒ සඳහා වැඩි පිරිවැයක් දරන්නට වෙයි."

# පෝස්ටර්,

# කටවුට් සහ

# තොරතුරු පත්‍රිකා

# මූලික අනෙයානය අවබෝධතාව

## මෙම අවකාශය:

### සුරක්ෂිතයි

මෙම පුහුණුවේ සියලුම තොරතුරු පෞද්ගලික මට්ටමෙන් තබාගන්න. මෙම සමූහයේ අනිත් සාමාජිකයන් සමග ඔබේ පෞද්ගලික දුරකතන අංක හුවමාරු කර නොගන්නා ලෙස අපි නිර්දේශ කරන්නෙමු.

### පොදු සමූහයකි

මෙහි සිටින අය විවිධ පසුබිම්වලින් ආ අය වන අතර, දැනුම් මට්ටම් හා දරන මත වෙනස් ය. අපගේ මේ පොදු අවකාශය තුළදී, අපි එකිනෙකාට ගරු කරමින්, උපකාර කළයුතුය.

### ධනාත්මක හා විවෘතයි

ඔබේ අදහස් දැක්වීමේ දී හා මත පළකිරීමේ දී, ගෞරවනීයව හා ධනාත්මකව හැසිරීමට වගබලා ගන්න. හරි හෝ වැරදි පිළිතුරු නොමැති අතර, අපේ කාර්යභාරය ඔබ පරීක්ෂා කිරීම නොවේ.

### සාධාරණයි

අපි කටයුතු කරන්නේ, කුඩා කණ්ඩායම් වශයෙන් වන අතර පොදු දුරකථන ඔබට ලබාදෙයි. සෑම කෙනෙකුටම ඇසීම සඳහා සහ දුරකථන භාවිතා කිරීම සඳහා සමාන අවස්ථා ලබාදීමට අපි කැමැත්තෙන් සිටිමු.

# ඉන්ටනෙට් හිදී ආරක්ෂා වීමට ඉඟි



ඔබ නොදන්නා පුද්ගලයන්
නොසළකා හැර,
ඔබට හිරිහැරයක් වන අය
'බ්ලොක් කර' දමන්න



ඔබේ පෞද්ගලික
තොරතුරු රහසිගතව
තබාගන්න



ඔබ දකින හෝ අත්විඳින
යමක් නිසා ඔබ අපහසුතාවට
පත් වේ නම්, ඒ ගැන ඔබ
හොඳින් දන්නා විශ්වාසදායක
අයෙකුට කියන්න



ආචාරශීලී වන්න.
අන් අයගේ
පෞද්ගලිකත්වයට
ගරුකරන්න.

# නිර්වචන

මොබයිල් ඉන්ටනෙට් පිළිබඳ දේශීයව අදාළ වන තොරතුරු ද
මීට ඇතුළත් කිරීමට පුහුණුකරුවන්ට හැක.

## 2G / 3G / 4G

ඔබ ඉන්ටනෙට් භාවිතා කිරීමේදී එය විවිධ වේගවලින් ධාවනය විය හැක. අඩුම වේගය සහිත ඉන්ටනෙට් හඳුන්වන්නේ, 2G ලෙසිනි. ඊට වඩා වේගවත් ඉන්ටනෙට් 3G ය. 4G යනු වේගවත්ම ඉන්ටනෙට් ය.

## App

ඔබේ ෆෝන්-එකේ ඇති සේවාවකට පිවිසිය හැකි කෙටි මාර්ගයක් ලෙස 'ඇප්' (app) හැඳින්විය හැක. ඉන්ටනෙට් සේවා සඳහා උදාහරණ : WhatsApp, Facebook, Google. මෙම ඇප් මගින් සෘජුවම ඉන්ටනෙට් වෙත පිවිසී එම සේවාව අත්විඳීමට හැකි මාර්ගයක් ලබාදේ.

## Address bar

www.india.in

ලිපින කලාපය (address bar) පෙන්වන්නේ, ඔබ සිටින්නේ කුමන වෙබ් අඩවියේ ද යන්න ය. ඔබ සිටින වෙබ් අඩවියේ ලිපිනය, සෑමවිටම 'ලිපින කලාපයේ' දිස්වේ. උදා : www.google.in

## Advert හෝ Ad

Buy Now!

'ඇඩ්' (Ad) යනු, ඔබට යමක් විකිණීමට උත්සාහ කරන තොරතුරු ලබාදීමකි. එවැනි 'ඇඩ්' මත ක්ලික් නොකිරීම හොඳ පුරුද්දකි.

- Ads ඔබේ තිරය මත මතුවිය හැකි වීඩියෝ හෝ රූප වේ.
- ඊට අමතරව, Google ප්‍රතිඵල ලැයිස්තුවේ ඉහළින්ම ඇති 'සබැඳිවල (links) හෝ තිරයේ දකුණු පැත්තේ ද Ads නිරූපනය වෙනු ඇත.

## Browser

වෙබ් බ්‍රවුසරය, හෝ සරලව 'බ්‍රවුසරය' යනු, වෙබ් අඩවිවලට පිවිසීමට හා බැලීමට ඉඩ සලස්වන පරිගණක වැඩසටහනකි. පහත දැක්වෙන්නේ පොදු බ්‍රවුසර් කීපයකි.;

GoogleChrome | MozillaFirefox | Opera | Microsoft Internet Explorer

## Data

ඔබ, ඔබේ ෆෝන්-එකෙන් ඉන්ටනෙට් වෙත පිවිසීමේ දී ඔබ භාවිතා කරන්නේ 'ඩේටා' ය. ඒවා ඔබේ මොබයිල් ජාල සැපයුම් ආයතනයෙන් හෝ පෙරගෙවීම් ලෙස 'ඩේටා' අලෙවිකරන වෙළඳසැළකින් මිලට ගතයුතුය.

## Feature phone

**ෆීචර් ෆෝන්,** ස්මාර්ට්ෆෝන්වලට වඩා අඩු ලක්ෂණ (features) සහිත ය. ස්පර්ශ කිරීමෙන් ක්‍රියාත්මක කළහැකි තිරයක් නැති නමුත්, සංගීතය වාදනය කිරීමේ හා ඡායාරූප ගැනීමේ හැකියාව එහි ඇත.

## Google

'ගූගල්' (Google) යනු, අන්තර්ජාලයෙන් ඕනෑම තොරතුරක් සෙවීම පහසු කරන අන්තර්ජාල සේවාවක් ලබාදෙන වෙබ් අඩවියකි.

# නිර්වචන

මොබයිල් ඉන්ටනෙට් පිළිබඳ දේශීයව අදාළ වන තොරතුරු ද
මීට ඇතුළත් කිරීමට පුහුණුකරුවන්ට හැක.

## Internet

ඉන්ටනෙට් යනු, ලොව පුරා ඇති මිලියන ගණනක පරිගණක; දුරකතන මාර්ග, පණිවුඩ චන්ද්‍රිකා සහ කම්බි මගින් එකිනෙකට සම්බන්ධ වී හැදුණු ජාලයකි. එය නිරන්තරයෙන්ම වර්ධනය වන අතර, එමගින් ඔබට ඉතා විශාල පරිමාණයක තොරතුරු හා සේවාවන් රැසක් ලබාගත හැකිවේ. ඉන්ටනෙට්, හැමදෙනාම වෙනුවෙනි. එය භාවිතාකිරීමට හැකි සහ නොහැකි අය ලෙස කිසිවෙකුට සීමා පනවා නැත. කම්පියුටරයක්, මොබයිල් ෆෝන්-එකක් හෝ ටැබ්ලට්-එකක් සමග 'ඩේටා' සම්බන්ධතාවක් ඇති ඕනෑම කෙනෙකුට ඉන්ටනෙට් වෙත පිවිසිය හැක.

## Link

'සබැඳියක්' (link) මගින් ඔබ එක් වෙබ් අඩවියකින් තවත් වෙබ් අඩවියක් වෙත සම්බන්ධ කරයි. අනෙත් වෙබ් අඩවියට යාමට, ඔබ විසින් එම 'සබැඳිය' ස්පර්ෂ කළයුතුය.

## Megabytes සහ Gigabytes

මෙගා බයිට්(MB) සහ ගිගා බයිට් (GB) යනු, ඔබ මොබයිල් ඉන්ටනෙට් භාවිතා කිරීමේ දී පරිභෝජනය කරන ඩේටාවල ඒකක වේ. GB යනු, MB මෙන් දහස් ගුණයකි. ඔබ සින්දුවක්, ඉන්ටනෙට් වෙතින් ඩවුන්ලෝඩ් කළොත් හෝ ඉන්ටනෙට් මතදීම ශ්‍රවණය කළොත්, 5MB පමණ වැයවේ (විනාඩියකට 1MB පමණ).

## Search

ඉන්ටනෙට් හි 'සෙවීම' (search function) ඔබ තොරතුරු සොයන දෑ පිළිබඳ සොයා ගැනීමට ඔබට උපකාරී වේ. 'සෙවීම් කොටුවක' (search box) ඔබ සොයන දේට අදාළ වචන ටයිප් කළවිට, ඊට අදාළ වියහැකි ප්‍රතිඵල 'සබැඳි' ලැයිස්තුවක් දැකිය හැකිවනු ඇත.

## Smartphone

අන්තර්ජාලයට පිවිසීමට හැකි, සංගීතය හා වීඩියෝ ගබඩා කර තබාගත හැකි, සහ 'ඇප්ස්' (apps) ධාවනය කළහැකි ආකාරයේ මොබයිල් ෆෝන්, 'ස්මාර්ට්ෆෝන්' ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් මේවාට 'ස්පර්ෂ කළහැකි' තිරයක් අයත් වේ.

## YouTube

'යුටියුබ්' (YouTube) යනු, ඉන්ටනෙට් හි ඇති බැලීමට සහ ඇසීමට හැකි වීඩියෝ සොයාගැනීම පහසු කරන ඉන්ටනෙට් සේවාවකි. (එහි ඇත්තේ වීඩියෝ පමණි).

## Website

ඉන්ටනෙට් හි තොරතුරු ඇත්තේ, විවිධ වෙබ් අඩවිවල (websites) ය. එකිනෙකට වෙනස් - විවිධාකාර වෙබ් අඩවි ඉන්ටනෙට් හි ඇත. උදා: Google යනු වෙබ් අඩවියකි. YouTube යනු තවත් වෙබ් අඩවියකි.


## WhatsApp

'වට්ස්ඇප්' (WhatsApp) යනු, ඔබ දන්නා පුද්ගලයන් (එනම්, පවුලේ අය, මිතුරන් හෝ සගයන් වැනි) සමග සම්බන්ධ වීමත්, පණිවුඩ හුවමාරු කරගැනීමත් පහසු කරන ඉන්ටනෙට් සේවාවකි.


## WiFi

'වයිෆයි කලාපයක්' (WiFi zone) යනු, ඔබට ඔබේ ෆෝන්-එකේ ඇති ඔබේ 'ඩේටා' භාවිතා නොකොට ඉන්ටනෙට් වෙත පිවිසීමට හැකි ප්‍රදේශයකි; එහිදී, ඔබට නොමිලේ ඉන්ටනෙට් වෙත පිවිසීමට ඉඩ ලැබේ. සමහර වෙළඳසැල් හා ආයතන වැනි පොදු ස්ථානවල, 'වයිෆයි කලාප' ඇත.

# ඉන්ටනෙට් යනු කුමක්ද?



# ඩේටා පිරිවැය








Icon Cutouts - Apps






Icon Cutouts - Phone Functions









# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී